09
පාඩම

# සේඛියා - I

**සේඛියා දහමින් හුරු පුරුදු වෙමු සුසිරිත් - 01**

ඒ අධිරජ ධර්මාශෝක ය. කුරිරු යුද්ධය නිසා හේ චණ්ඩාශෝක නම් විය. සිදු වූ මහා යුද අපරාධවලින් සිත වාවාගත නොහැකිව හේ සී මැදුරු කවුළුවෙන් බලාගත් වන ම සිටී. එක් වරම ඔහු නෙත ගැටුනේ සත් හැවිරිදි දරුවෙකි. කුඩා පැවිදි රුවකි. උන්වහන්සේ වඩාත් දුර ද ළඟ ද නොබලති. වටපිට ද නොබලති. වියදඬු පමණ යොමාගත් නෙත් ඇතිව සන්සුන්ව පියමන් කරති. දුටුවන්ගේ නෙත් සිත් පැහැර ගන්නේ ය. ප්‍රසන්න ය. ඒ නිග්‍රෝධ නම් සාමණේරයන් වහන්සේ ය. උන්වහන්සේගේ මේ ඉරියව් චණ්ඩාශෝකගේ සිත පැහැර ගත්තේ ය. උන්වහන්සේ රජමැදුරට කැඳවන ලදී. සුදුසු අසුනක හිඳිනා ලෙස ඇරයුම් ලැබ සිහසුනේ වැඩ හුන්හ. දහමක් දෙසන ලෙස අයදුමෙන් ''**අප්පමාදො අමතපදං**''..... ආදී දහම් දේශනාව වදාළහ. චණ්ඩාශෝක ධර්මාශෝක විය. ''**යො හවෙ දහරො භික්ඛු**''..... කුඩා භික්ෂු නමක් වුව ද සසුනෙහි සංවරව විනීතව සසුන් කිසෙහි මැනවින් යෙදෙත් නම් උන්වහන්සේ වළාකුලෙන් මිදුන සඳ සේ මෙලොව බබලවන්නේ ය. එදා ඒ කුඩා සාමණේරයන් වහන්සේ කළ මෙහෙවර නොවන්නට අද ලක්දිව පමණක් නොව මුළු ලොව ම බුදුදහම නොතිබෙන්නට ඉඩ තිබුණි. සන්සුන් හිමිනමකට පෑ හැකි ප්‍රාතිහාර්ය කෙතරම් ද? සේඛියා යනු ඒ කුඩා සාමණේර නමකගේ හික්මීමේ පිළිවෙතයි.

විනය යනු හික්මීම හෙවත් සංවරකමයි. හීලෑකමයි. හැදිච්චකමයි. සීලය යනු ද විනයමයි. එයින් කය වචනය සංවර වෙයි. කෙලෙස් ධර්මයන් යටපත් වී සිත ද හික්මෙයි. එනිසා නිවන් මගට ද අනිවාර්යයෙන් උපකාර වන ධර්මයකි. එමනිසා සංවරය ගිහි පැවිදි හැමදෙනාට ම අත්‍යවශ්‍ය වූවෙකි. බුදුරජාණන් වහන්සේ විසින් ශික්ෂා පද පනවන ලද්දේ, මේ සියලු කරුණු හේතු කොට ගෙන ය. ඕනෑම සමාජයක යහ පැවැත්ම සඳහා විනය නීති (ව්‍යවස්ථා) මාලාවක් තිබිය යුතු වෙයි. ඒ ඒ සමාජයට ආවේණික වූ විනය නීති මාලාවක් වෙන් වෙන්ව ඇත. එම විනය නීතිවලට අනුව කටයුතු කරන තාක් කල් එම සමාජය පිරිහීමට පත් නොවෙයි. බුදුරජාණන් වහන්සේ විසින් සංඝ සමාජය සඳහා ද විනය නීතිමාලාවක් පනවන ලදී. ඒවා පාරාජිකා පාලි, පාචිත්තිය පාලි, පරිවාර පාලි, චුල්ලවග්ග පාලි සහ මහ වග්ග පාලි යන විනය ග්‍රන්ථවල ඇතුළත් වෙයි. භික්ෂූන් වහන්සේලා හැමවිට ම එම විනය නීති මාලාවට ගරු කළ යුතු බව උන්වහන්සේ දේශනා කළහ. භික්ෂූන් වහන්සේ හැමවිටම විනයානුකූලව කටයුතු කරත් නම් විනය නීතී උල්ලංඝණය නොකරත් නම් ඒ තාක් කල් භික්ෂූන් වහන්සේත් භික්ෂු සමාජයත් පරිහාණියට පත් නොවේ.

**''අප්පසන්නානං වා පසාදාය පසන්නානංවා භීයොභාවාය''**

යන බුදු වදනට අනුව අප නො පැහැදුණු අයගේ පැහැදීම පිණිස ද පැහැදුණු අයගේ වඩාත් පැහැදීම පිණිස ද ක්‍රියා කළ යුතු ය. අප අහර වළඳන අඳින-පොරවන ගමන්-බිමන් කරන යන එන හැමවිටකම හැමතැනකම ආචාර සම්පන්න වීම අවශ්‍ය ය. සේඛියා යනු එසේ එදිනෙදා ප්‍රායෝගික ජීවිතයේ දී ලොකු කුඩා සැම භික්ෂුවක් විසින් ම අනුගමනය කළයුතු ආචාරධර්ම පද්ධතියයි. ඒවා ගණනින් පන් සැත්තෑව (75) කි. මෙම ආචාර ධර්ම ඕනෑම ශිෂ්ට සමාජයක තිබිය යුතු වැදගත් පිළිවෙත් ය. මේවායින් හික්මුණු පුද්ගලයා රජ සබයට වුව ද සුදුසු ය. සමාජයේ උසස් යැයි සම්මත ඇතැම් අය පවා මේ ආචාර ධර්ම නොසලකා හැරීම නිසා සමාජ පිළිකුලට පාත්‍රවනු අප දැක තිබේ. එසේ ම එවැනි ශක්තියක් බලයක් නොමැති වුව ද මේ ආචාර ධර්ම ආරක්ෂා කරන ඇතැම් පුද්ගලයින් සමාජයේ ප්‍රශංසාවට ලක්වන අයුරු ද අප නෙත ගැටී තිබේ.

## සේඛියා පැනවීමට මුල් වූවන් (හේතු)

බුදුරජාණන් වහන්සේ ජීවමාන සමයේ මේ ආචාර ධර්ම ගරු නොකළ ඇතැම් පෘථග්ජන භික්ෂූන් වහන්සේලා වාසය කොට තිබේ. ඒ අතරින් අස්සජි, පුනබ්බසුක, පණ්ඩුක, ලෝහිතක, මෙත්තිය සහ බුම්මජක නමින් හැඳින්වෙන ඡබ්බග්ගිය (හයේ කණ්ඩායම) භික්ෂූන් ප්‍රධාන වෙති. මේ සේඛියා සිකපදවලින් බොහෝමයක් පනවන ලද්දේ උන්වහන්සේලාගේ විෂමාචාරයන් නිසා ය. ඔවුන්ගේ විෂමාචාර අසංවර චර්යා සේඛියා හැත්තෑ තුනකට ම නිදානය වී තිබේ. කොසඹෑ නුවර ඝෝෂිතාරාමයේ දී භික්ෂූන් වහන්සේලා සුරු සුරු හඬ නගමින් අහර වැළඳීම නිසා පනස් එක් වැනි සේඛියාව (න සුරු සුරු කාරකං.....) පනවනු ලැබී ය. පනස් පස් වැනි සේඛියාව වූ ඉඳුල් අතින් පැන් තලිය නොගත යුතු ය යන ශික්ෂාව (න සාමිසෙන හත්‍ථෙන....) පනවන ලද්දේ භග්ග ජනපදයේ සුංසුමාර ගිරියෙහි භේසකලා වනයෙහි දී භික්ෂූන් වහන්සේලා ඉඳුල් අතින් පැන් භාජනය ගැනීම නිසා ය. මේ අනුව අනෙකුත් විනය නීති සේම සේඛියා ද පනවනු ලැබුවේ හේතුවක් පදනම් කරගෙන ම ය.

## සේඛියා වර්ගීකරණය

ප්‍රාතිමෝක්ෂයෙහි සේඛියා හැත්තෑ පහ කොටස් හතකට බෙදා දක්වා ඇත. හැඳීම් පෙරවීම් ගමෙහි හැසිරීම් ආදී විවිධ තේමා අනුව මෙම බෙදා දැක්වීම සිදු වී ඇත. එය පෙළ පාඩම් කර ගැනීම සඳහා ද පහසුවකි. ඒ මෙසේ ය.

1. **පරිමණ්ඩල වග්ග** 10
2. **උජ්ජග්ඝික වග්ගි** 10
3. **ඛම්භකත වග්ග** 10
4. **සක්කච්ච වග්ග** 10
5. **කබල වග්ග** 10
6. **සුරු සුරු වග්ග** 10
7. **පාදුකා වග්ග** 15

යනුවෙනි. මෙහි දී අප සාකච්ඡා කරනුයේ දෙවැනි ශ්‍රේණියේ දී සාකච්ඡා නොකළ කොටස් ය.

## උජ්ජග්ඝික වග්ගය - 10

**(ගමෙහි හැසිරීම හා වැඩහිඳීම)**

මිනිසා යනු සමාජ සත්ත්වයෙකි. ඔහු නිරන්තරයෙන් චර්යාවන් ප්‍රදර්ශනය කරන අවස්ථා දෙකකි. එනම්, කය සහ වචනය යි. කායික වාචසික සංවරය සීලාචාරකම යි. ඒවායෙහි අසංවර බව අසීලාචාරකම යි. සීලාචාරකමට සමාජයේ වැදගත්කමක් ඇති අතර අසීලාචාරකමට ඇත්තේ, පිළිකුලකි. එමනිසා ගිහි-පැවිදි භේදයකින් තොරව සීලාචාරකමෙහි වැදගත්කම ඉස්මතු වන්නේ ය. දෙවන ''උජ්ජග්ඝික වග්ගයේ'' දී අපේක්ෂා කරන්නේ ගමෙහි හැසිරෙන භික්ෂුව විසින් ප්‍රදර්ශනය කළයුතු සීලාචාරකමයි.

''**උජ්ජග්ඝික**'' වග්ගයෙහි භික්ෂූන් වහන්සේ නමක් ගමෙහි හැසිරීම හා වැඩහිඳීම පිළිබඳ ව ශික්ෂා පද දහයක් ඇතුළත් වේ. ''**උජ්ජග්ඝික**'' යනු මහ හඬින් සිනාසීමයි. මහ හඬින් සිනා ඇතිව ඇතුලු ගමෙහි හෝ නගරයෙහි වැඩමවීම හෝ වැඩහිඳීම නො කළ යුතු ය. විශේෂයෙන් සිනහ මුසු මුවින් සිටීම භික්ෂුවකගේ අනන්‍යතාවකි. අනතිමානී බවෙහි සංකේතයකි. එහෙත් එය අනෙකාගේ ප්‍රසාදය දැනවෙන ආකාරයෙන් සිදු විය යුතු ය. තවෙකකු අපහාසයට හෝ උපහාසයට ලක්වන ආකාරයෙන් සිදු නොවිය යුතු ය. තවද අනෙකාගේ අප්‍රසාදයට හේතු නො විය යුතුවේ. ''**කොමාරකමිදං භික්ඛවෙ අරියස්ස විනයෙ යදිදං අතිවෙලං දන්තවිදංසකං හසිතං**'' යනුවෙන් බොහෝ වේලා දත් විදහා සිනහාසීම බොළඳ ක්‍රියාවකැයි, දේශනා කොට තිබේ. එසේ ම ''**අලං වො ධම්මප්පමොදිතානං සිතං සිතමත්තං**'' යනුවෙන් භික්ෂුවකට දත් නොපෙනෙන සේ කරන මඳසිනහව සුදුසු යැයි දක්වා තිබේ. උස් හඬින් සිනාසෙමින් මහජනයා අතර හැසිරීම භික්ෂුවකට කිසිසේත් ම නොගැලපෙයි.

මීළඟට ගමෙහි මහජනයා අතර හැසිරීමේ දී සැළකිලිමත් වියයුතු හැසිරීම් හතරක් මෙම වග්ගයේ දී දැක්වේ. ''අප්පසද්දො'' යන්නෙන් භික්ෂුවක් ගමෙහි හැසිරෙන විට දී කතාබහ කරන විට හැකිතරම් මඳ හඬින් කතා කළයුතු බව කියවෙයි. මෙයින් ධර්ම දේශනා හෝ පිරිත් දේශනා අදහස් නොකෙරේ. සාමාන්‍යයෙන් මිනිසුන්ගේ ගමනබිමනේ දීත් ඉඳගෙන සිටින විට ද කතාබස් කරන විට ද අතපය විසිකිරීම් පැද්දීම් සෙළවීම් නිතර දක්නට ලැබේ. එබඳු යම්යම් අවිනීත හැසිරීම් බොහෝ අයට ඇබ්බැහි වී තිබෙනු පෙනේ. එය අනෙකාගේ උපහාසයට හෝ හාස්‍යයට ලක්වන බව ඇතැම් විට ඔවුන්ට දැනෙන්නේ නැත. ''කායප්පචාලකං'' යනු කය ඒ මේ අත සොළවමින් යමක් කිරීම හෝ හිඳගෙන සිටීමයි. ''බාහුප්පචාලකං'' යනු දෑත එහෙ මෙහෙ අත සොළවමින් ගමන් කිරීම හිඳීම හෝ දම් දෙසන විට අනවශ්‍ය පරිදි දෑත් සෙළවීම නොකළ යුතු බවයි. එයින් යම් යම් කරුණු පැහැදිලි කිරීම සඳහා යොමු කරන හස්ත මුද්‍රා අදහස් නොකෙරේ. ''සීසප්පචාලකං'' යනු හිස එහේ මෙහේ සෙළවීමයි.

කුඩා කල සිට ම භික්ෂුවක් මේ සේඛියාවලට පුහුණු කරවන්නේ එබඳු ඇබ්බැහිවීම් ඇති නොවන්නට ය. භික්ෂූන් වහන්සේ නමක් ළඟ අනුන්ගේ උපහාසයට ලක්වන එබඳු හැසිරීම් කිසිවක් නොතිබිය යුතු ය. භික්ෂුවක් කාගේත් ප්‍රසාදයට ලක්වන කෙනෙක් වන්නේ මේ හැසිරීම්වලින් තොර වූ විටයි.

### උජ්ජග්ඝික වග්ගය - පෙළ සහ තේරුම

01. **න උජ්ජග්ඝිකාය අන්තරඝරෙ ගමිස්සාමී'ති සික්ඛා කරණීයා.**
හඬ නගා සිනාසෙමින් ඇතුළු ගමෙහි නොයන්නෙමි'යි හික්මිය යුතු ය.

02. **න උජ්ජග්ඝිකාය අන්තරඝරෙ නිසීදිස්සාමී'ති සික්ඛා කරණීයා.**
හඬ නගා සිනාසෙමින් ඇතුළු ගමෙහි නොහිඳින්නෙමි'යි හික්මිය යුතු ය.

03. **අප්පසද්දො අන්තරඝරෙ ගමිස්සාමී'ති සික්ඛා කරණීයා.**
වැඩි ශබ්දයකින් තොරව ඇතුළු ගමෙහි යන්නෙමි'යි හික්මිය යුතු ය.

04. **අප්පසද්දො අන්තරඝරෙ නිසීදිස්සාමී'ති සික්ඛා කරණීයා.**
වැඩි ශබ්දයකින් තොරව ඇතුළු ගමෙහි නො හිඳින්නෙමි'යි හික්මිය යුතු ය.

05. **න කායප්පචාලකං අන්තරඝරෙ ගමිස්සාමී'ති සික්ඛා කරණීයා.**
ඇඟපත සොලවමින් ඇතුළු ගමෙහි නො යන්නෙමි'යි හික්මිය යුතු ය.

06. **න කායප්පචාලකං අන්තරඝරෙ නිසීදිස්සාමීති' සික්ඛා කරණීයා.**
ඇඟපත සොලවමින් ඇතුළු ගමෙහි නො හිඳින්නෙමි'යි හික්මිය යුතු ය.

07. **න බාහුප්පචාලකං අන්තරඝරෙ ගමිස්සාමී'ති සික්ඛා කරණීයා.**
අත් සොළවමින් ඇතුළු ගමෙහි නො යන්නෙමි'යි හික්මිය යුතු ය.

08. **න බාහුප්පචාලකං අන්තරඝරෙ නිසීදිස්සාමී'ති සික්ඛා කරණීයා.**
අත් සොළවමින් ඇතුළු ගමෙහි නො හිඳින්නෙමි'යි හික්මිය යුතු ය.

09. **න සීසප්පචාලකං අන්තරඝරෙ ගමිස්සාමී'ති සික්ඛා කරණීයා.**
හිස වනමින් ඇතුළු ගමෙහි නො යන්නෙමි'යි හික්මිය යුතු ය.

10. **කායප්පචාලකං අන්තරඝරෙ නිසීදිස්සාමී'ති සික්ඛා කරණීයා.**
හිස වනමින් ඇතුළු ගමෙහි නො හිඳින්නෙමි'යි හික්මිය යුතු ය.

**අභ්‍යාස**

01. විනය යන්නෙහි වචනාර්ථය පැහැදිලි කරන්න.
02. ''සේඛියාවන්හි මා දකින වැදගත්කම'' යන මාතෘකාව යටතේ රචනාවක් ලියන්න.
03. සේඛියා අර්ථ සහිතව වනපොත් කරන්න.

''මේ ශාසනය කෛරාටිකයන්ගේ වත් දුෂ්ටයන්ගේ වත් නොව
මහා කාරුණික බුදුරජාණන් වහන්සේගේ ය. එහෙයින්
උන්වහන්සේ වෙනුවෙන් ජීවත් වෙනු.
සිවුරු හරින්නට එපා.........

- හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමි -

සන්තින්‍ද්‍රියා සන්තමානසා
සන්තං තෙසං ගතං ඨිතං
ඔක්ඛිත්ත චක්ඛු මිතභාණි
තාදිසා සමණා මම

ඉන්‍ද්‍රිය සංවරය. මනස සන්සුන්ය.යන එන සිටින විට බිමට හරවාගත් ඇස් වෙති. පමණට කතා කරති. මාගේ ශ්‍රමණයන් වහන්සේලා එබඳුය.

කායකම්මං සුචී තෙසං
වාචාකම්මං අනාවිලං
මනො කම්මං සුවිසුද්ධං
තාදිසා සමණා මම

මාගේ ශ්‍රමණයන් වහන්සේලා කයෙන් පිරිසිදුය. වචනයෙන් පිරිසිදුය. නොකැළැල් ය. මනස පිරිසිදුය. මාගේ ශ්‍රමණයන් වහන්සේලා එබඳුය.

- ධම්මපදට්ඨ කථා - චූළ සුභද්දා වත්ථු-